මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/1/3 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.07. 19

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 01/2021**

දකුණු පළාත් සභාවේ සියලුම

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා

ගණන්දීමේ නිලධාරීන් වෙත,

**අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ අධිකාරි හා ව්‍යවස්ථාපිත ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීම**

අභ්‍යන්තර විගණනය වූ කලි සංවිධානයක් තුල කෙරෙන ස්වාධීන තක්සේරුවකි. කළමනාකරණ ඒකකයක සියලු මට්ටම් වෙතින් ඉටු කෙරෙන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය කිරීම, මැන බැලීම, ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ සිද්ධි දායකභාවය සම්බන්ධයෙන් වාර්තා කිරීම ද ඊට අයත් වේ. එමෙන්ම අභ්‍යන්තර විගණනය ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නංවා ගැනීම සඳහා ද මනා පිටුවහලක් වේ.

02. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සහ 2021.03.01 දින සිට බලාත්මක කරන ලද නව දකුණු පළාත් සභා මූල්‍ය රීති 82.7 අනුව පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්වාධීනව පවත්වාගෙන යා යුතුය.

03. ඒ අනුව අභ්‍යන්තර විගණන ඒකක මෙතෙක් පිහිටුවා නොමැති සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි හා ව්‍යවස්ථාපිත ආයතනවල 2021.08.01 දිනට ප්‍රථම අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ඒ බව පළාත් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය.

04. මෙම අභ්‍යන්තර විගණන ඒකක දැනට ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි යටතේ පවත්වාගෙන යායුතු අතර, ආයතනයේ පවතින භෞතික හා මානව සම්පත් මේ සඳහා යොදා ගැනීමට ක්‍රියා කළ යුතුවේ.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

05. අභ්‍යන්තර විගණන ඒකකවල විගණන වාර්තා අවස්ථාවෝචිත පරිදි සෘජුවම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට, ගණන්දීමේ නිලධාරියාට හෝ පාලක මණ්ඩලයට යොමු කළ යුතු අතර, පිටපතක් සහකාර විගණකාධිපතිට හා දකුණු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂට ඉදිරිපත් කළ යුතුය.

06. සියලුම අභ්‍යන්තර විගණන ඒකකවල කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත යුතුය. තවද, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක : DMA/01-2019 හා 2019.01.12 දිනැති අභ්‍යන්තර විගණනය සඳහා වූ මාර්ගෝපදේශ සහ රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන් සඳහා වන අත්පොත, දකුණු පළාත් සභා නව මූල්‍ය රීති සංග්‍රහය හා වරින් වර නිකුත් කරනු ලබන මේ පිළිබඳව වූ චක්‍රලේඛ හා උපදෙස් සුදුසු පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සහාය කරගත හැකිය.

07. අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා මනා අභ්‍යන්තර පාලනයක් තම ආයතන තුල ස්ථාපිත කර කාර්යසාධනය ඉහළ නැංවීම බලාපොරොත්තු වන අතර, එය ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

ආර්.සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

1. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.ක.ස. හා දැ.ගැ.ස.